# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2310/28 - 2022 දෙසැම්බර් මස 14 වැනි බදාදා - 2022.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 සහ 40 වන වගන්ති සමඟ කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රොෂාන් රණසිංහ (පා.ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

කලින් කල සංශෝධිත 2016.10.27 හා අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග, ක්‍රීඩාවලට ධෛර්යය දීම, ක්‍රීඩාව දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහාත් ක්‍රීඩාවේ, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හා ක්‍රීඩාවේ නියැලෙන්නන්ගේ අභිවෘද්ධිය සඳහාත් එය බිම්මට්ටම දක්වා ගෙන යන ක්‍රීඩා සමාජවල සංයුතිය තීරණය කිරීම සහ ඒවා නියාමනය කිරීම සඳහාත් පහත පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) කලින් කල සංශෝධිත 2016.10.27 හා අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල II කොටසේ 5 වන නියෝගයේ (4) (ඩ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කරමින් ද, එකී නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(4) (ඩ) භාණ්ඩාගාරික හෝ සහකාර භාණ්ඩාගාරික හැර, එම සංගමය විසින් ලියාපදිංචි කරන ලද, ප්‍රවර්ධනය කරන ලද, මෙහෙයවන ලද හෝ අනුමත කරන ලද යම් ප්‍රධාන ක්‍රීඩා තරගාවලියක දී හෝ තරගයක දී, ජාතික මහා ක්‍රීඩා තරගාවලියක දී හෝ තරගයක දී, එම අදාළ ක්‍රීඩාව සම්බන්ධයෙන් කණ්ඩායම් ක්‍රීඩාවක් සඳහා වාර දෙකකට වැඩි වාර ගණනක් හෝ යම් තනි ඉසව්වක් සඳහා හෝ ක්‍රීඩාවක් සඳහා එක් වාරයකට වඩා වැඩි වාර ගණනක් වෙනුවෙන් සහභාගී වී නොමැති නම් හෝ ජාතික තලයේ ක්‍රීඩකයකු ලෙස පිළිගත් ජාත්‍යන්තර තරගයක දී ශ්‍රී ලංකාව නියෝජනය කර නොමැති නම් සහ ඒ සඳහා අදාළ වන ආකාරයට නිකුත් කරන ලද සහතිකයක් සතුව නොමැති නම්; "

1A - G 38349— 08 (2022/12)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(2) (i) එකී නියෝගවල III වන කොටසේ 7 වන නියෝගයේ (ii) ඡේදයට ඉක්බිතිව ම, පහත ඡේදය ආදේශ කිරීමෙන් ද;

(ii) (අ) අදාළ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම, එකී ක්‍රීඩාවට අදාළව වාර්ෂිකව, අන්තර් ප්‍රාදේශීය, අන්තර් දිස්ත්‍රික්, අන්තර් පළාත්, ක්‍රීඩා තරග දෙකකට නොඅඩු ප්‍රමාණයක් පැවැත්වීම, ක්‍රීඩකයින්ගේ පුහුණුව සහ ස්ථිර සංචිත පවත්වාගෙන යාම;

(iii) එකී නියෝගවල III වවන කොටසේ 7 වන නියෝගයේ (xiv) ඡේදය ඉවත් කර, පහත ඡේදය ඒ වෙනුවට ආදේශ කිරීමෙන් ද;

7 (xiv) වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම; සහ

(අ) ජාතික ක්‍රීඩා සංගමයේ / සම්මේලනයේ නිලවරණයෙන් විධායක කමිටුව පත් වූ වහාම විධායක සභාව මගින් තාක්ෂණික කමිටුවේ, මුදල් කමිටුවේ, විනය කමිටුවේ සාමාජිකයින් අවුරුදු දෙකක (02) කාලයකට තෝරා පත් කර ගැනීම සඳහා සියලු සාමාජික අනුබද්ධ ආයතන දැනුවත් කර, නාමයෝජනා ලබා ගෙන සුදුසුකම් අනුව පත්කර ගැනීම.

(ආ) ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලනවල තේරීම් කමිටුව අවුරුදු දෙකක (02) කාල සීමාවකට පත් කිරීම සඳහා, අදාළ ජාතික ක්‍රීඩා සංගමය / සම්මේලනය තම ක්‍රීඩා සංගමයට / සම්මේලනයට අනුබද්ධ සියලුම සාමාජික ආයතන නිසි පරිදි දැනුවත් කොට නාම යෝජනා ලබා ගෙන, විධායක කමිටු රැස්වීමක් මගින් වඩා සුදුසු සාමාජිකයන් දස දෙනෙකු (10) තෝරා ගැනීම කළ යුතු අතර, තෝරා ගන්නා ලද නාමයෝජනා ලේඛනය සහිත අයදුම්පත්‍ර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද පිටපතක් සහිතව ජාතික තේරීම් කමිටුව වෙත යොමු කිරීම, ජාතික තේරීම් කමිටුව විසින් එම නාමයෝජනා පිළිබඳව තම නිර්දේශිත කමිටු නාමලේඛනය ජාතික ක්‍රීඩා සභාව වෙත යොමු කිරීම සහ ජාතික ක්‍රීඩා සභාව විසින් එම නිර්දේශ තවදුරටත් සලකා බලා සභාවේ නිර්දේශ සමඟ අමාත්‍යාංශ ලේකම් මගින් අනුමැතිය සඳහා විෂයභාර අමාත්‍යවරයා වෙත යොමු කිරීම ; සහ,

(ඇ) නිලවරණ කමිටුවේ සාමාජිකයින් තෝරා පත් කර ගැනීම සඳහා විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීම,

(iv) එකී නියෝගවල III වන කොටසේ 7 වන නියෝගයේ (xx) ඡේදයට ඉක්බිතිවම (xx) (අ), (xx) (ආ) සහ (xx) (ඇ) ලෙස පහත ඡේද එකතු කිරීමෙන් ද;

"(xx) (අ) ජාතික ක්‍රීඩා සංගම්වල පහළම ඒකකය වන ප්‍රාදේශීය ක්‍රීඩා සමාජවල සිට දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් සහ පළාත් ක්‍රීඩා සංගම්, ජාතික ක්‍රීඩා සංගමයේ අනෙකුත් සාමාජික ප්‍රධාන ක්‍රීඩා සමාජවල ද අධීක්ෂණ සහ නියාමන කටයුතු පහසුවනු පිණිස ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා ඉදිරිපත් කිරීම.

(xx) (ආ) දිස්ත්‍රික් ක්‍රීඩා සංගමය විසින් සිය බල ප්‍රදේශය තුළ අදාළ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම, වාර්ෂිකව ප්‍රාදේශීය තරගාවලි 02කට නොඅඩු ප්‍රමාණයක් පැවැත්වීම, ක්‍රීඩකයින්ගේ පුහුණුව සහ ස්ථිර සංචිත පවත්වාගෙන යාම සිදු කරන්නේ ද යන්න සහ දිස්ත්‍රික් සංගමය විසින් නිසි ක්‍රමවේදයක් පරිදි ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන්නේ ද යන්න සොයා බලා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කිරීම.

(xx) (ඇ) පළාත් ක්‍රීඩා සංගමය විසින් සිය බල ප්‍රදේශ තුළ අන්තර් දිස්ත්‍රික් ක්‍රීඩා තරගාවලි 02කට නොඅඩු ප්‍රමාණයක් වාර්ෂිකව පවත්වා තිබීම, ක්‍රීඩකයින්ගේ පුහුණුව සහ ස්ථිර පළාත් ක්‍රීඩා සංචිත පවත්වාගෙන යාම, තම බල ප්‍රදේශය තුළ අදාළ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම, පළාත් ක්‍රීඩා සංගම් විසින් දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් නියාමනය හා අධීක්ෂණය නිසි පරිදි සිදු කරන්නේ ද යන්න පිළිබඳ තොරතුරු ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීම.

(3) එකී නියෝගවල III වැනි කොටසේ 7 වන නියෝගයේ (xxv) ඡේදයට ඉක්බිතිව ම, පහත අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ද එකී නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7(xxvi) ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගමය තම ක්‍රීඩාවට අදාළ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගෙන් (දෘශ්‍යාබාධිත, ශ්‍රවණාබාධිත, කායික ආබාධිත යනාදි) සමන්විත අනුබද්ධ ක්‍රීඩා සමාජ ඇතුළත් කර ගැනීම වගකීමක් වන්නේ ය.

(4) එකී නියෝගවල III වැනි කොටසේ 7 වන නියෝගයේ (xxvii) ඡේදයට ඉක්බිතිව ම, පහත අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ද එකී නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7 (xxviii) ජාතික ක්‍රීඩා සංගම් ජාත්‍යන්තර ගිවිසුම්වලට, ජාත්‍යන්තර මුදල් ගණුදෙනුවලට එළඹීමේ දී, රටේ මූල්‍ය නීතියට යටත්ව, මූල්‍ය විනයක් සහිතව, විනිවිදභාවයෙන් ක්‍රියා කළ යුතු අතර, එවැනි ගිවිසුම් විෂයභාර අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස අමාත්‍යංශ ලේකම්වරයාගේ පූර්ණ නිර්දේශයට යටත්ව, විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය.

(5) එකී නියෝගවල VI වන කොටසේ අර්ථ නිරූපණය යටතේ 'ජාතික ක්‍රීඩා සංගමය' යන්නෙන් වන අර්ථ නිරූපනය ඉවත් කර, පහත අර්ථ නිරූපනය ආදේශ කරමින් ද;

"ජාතික ක්‍රීඩා සංගමය" යන්නෙන් 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 28 වන වගන්තිය යටතේ නම් කරන ලද ක්‍රීඩාවක් නැතහොකන් ක්‍රීඩා පන්තියක් පාලනය කරන සංගමයක්, ඒකාබද්ධ සංගමයක් හා මණ්ඩලයක් අදහස් වේ.

සෑම ජාතික ක්‍රීඩා සංගමයක් ම / සම්මේලනයක් ම, ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ එකතුවෙන් සෑදෙන දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් ද, දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් එකතුවෙන් සෑදෙන පළාත් ක්‍රීඩා සංගම්වලින් සහ ප්‍රධාන වශයෙන් ක්‍රීඩාවට දායකත්වය ලබා දෙන අනෙකුත් විශේෂ සංගම් හෝ සංවිධානවලින් සකස්වන සංගමයක් විය යුතු ය.

ජාතික ක්‍රීඩා සංගම් විසින් ශ්‍රී ලංකාවේ පවත්නා නීති, ක්‍රීඩා පනත් සහ ඒ හා සම්බන්ධ නියෝග සහ විධිවිධානවලට යටත්ව, තම සංගමයට අදාළව ව්‍යවස්ථාවක් සකස් කළ යුතු අතර, එම ව්‍යවස්ථාව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය. ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් සහා අනෙකුත් සංගම් විසින් ඉහත අනුමත කරන ලද ජාතික ක්‍රීඩා සංගම් ව්‍යවස්ථාව පරිදි ක්‍රියා කළ යුතු අතර, ඒ ඒ සංගමවලට සීමා වූ, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් ව්‍යවස්ථාවක් නොතිබිය යුතු ය.

එකී නියෝගවල VI වන කොටසේ අර්ථ නිරූපණයේ "ජාතික ක්‍රීඩා සංගමය" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත සඳහන් නව අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් ද; එකී නියෝගය තවදුරටත් 'සංශෝධනය කරනු ලැබේ.

"ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ" යන්නෙන් යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ එම ක්‍රීඩාවට අදාළව පිහිටා ඇති ක්‍රීඩා සමාජ අදහස් වේ.

"දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්' යන්නෙන් ඒ ඒ දිස්ත්‍රික්කය තුළ පිහිටි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි පිහිටුවා ඇති ප්‍රාදේශීය ක්‍රීඩා සමාජවල එකතුවක් අදහස් වේ. ප්‍රාදේශීය ක්‍රීඩා සමාජවල වගවීම දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්වලට හා පළාත් ක්‍රීඩා සංගම්වලට විය යුතු අතර, ඒවා නියාමනය කිරීමේ වගකීම දිස්ත්‍රික්, පළාත් සහ ජාතික ක්‍රීඩා සංගම් වෙත පැවරේ.

"පළාත් ක්‍රීඩා සංගම්" යන්නෙන් ඒ ඒ පළාත තුළ පිහිටි සියලු දිස්ත්‍රික්කවල සියලු ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි, ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ පිහිටුවා ඇති දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්වල එකතුවකි. දිස්ත්‍රික් සංගම්වල වගවීම පළාත් සහ ජාතික ක්‍රීඩා සංගම් වෙත වන අතර, ඒවා නියාමනය කිරීමේ වගකීම පළාත් සහ ජාතික ක්‍රීඩා සංගම් වෙත පැවරේ.

'විශේෂ සංගම්' යන්නෙන් ක්‍රීඩාවේ නියැලෙන රාජ්‍ය සේවා, ජනසතු සේවා, වෙළෙඳ සේවා, ආරක්ෂක සේවා සහ ඒකාබද්ධ විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය, මහවැලි ක්‍රීඩා සංගමය, තරුණ සේවා ක්‍රීඩා සංගමය ආදි ක්‍රීඩා සංගම් අදහස් වේ.

(6) එකී නියෝගවල III වන උපලේඛනයේ 'බ" ඡේදයට ඉක්බිතිව ම, පහත 'ම' ඡේදය ඇතුළත් කිරීමෙන් එකී උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''ම" සෑම ජාතික ක්‍රීඩා සංගමයක් හෝ සම්මේලනයක් සඳහා නියෝජනය කරනු ලබන සාමාජික සංගම් සඳහා ඡන්ද හිමිකම ;

i. ප්‍රාදේශීය ක්‍රීඩා සමාජයකට එක් ඡන්දයකට හිමිකමක් ඇති අතර, එම ඡන්ද එකතුවෙන් දිස්ත්‍රික් ක්‍රීඩා සංගමය තෝරා පත් කර ගත යුතු අතර, එවන් සුදුසුකම් සපුරා ඇති දිස්ත්‍රික් ක්‍රීඩා සංගමයකට ජාතික සංගම් නිලවරණයේදී එක් ඡන්දයක් ද;

ii. ඒ ඒ පළාත තුළ පිහිටුවා ඇති දිස්ත්‍රික් ක්‍රීඩා සංගමයකට එක් ඡන්ද හිමිකමක් ඇති අතර, එම දිස්ත්‍රික් ඡන්දයෙන් පළාත් ක්‍රීඩා සංගම් පිහිටුවා ගත යුතු අතර, එවන් පළාත් ක්‍රීඩා සංගමයකට ජාතික සංගම් නිලවරණයේ දී එක් ඡන්දයක් ද;

iii. සෑම ක්‍රීඩාවකට ම පුරෝගාමී ක්‍රීඩා සමාජ වෙතොත් එම ක්‍රීඩා සමාජ සඳහා එක් ඡන්දයක් ද,

iv. ක්‍රීඩාවේ නියැලෙන විශේෂ සංගම් ගණයේ ලා සැලකෙන රාජ්‍ය සේවා, ජනසතු සේවා, වෙළෙඳ සේවා, ආරක්ෂක සේවා සහ ඒකාබද්ධ විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය, මහවැලි ක්‍රීඩා සංගමය, තරුණ සේවා ක්‍රීඩා සංගමය ආදියට අයත් ව්‍යවස්ථාවන් තුළ සාමාජිකත්වය සඳහා එක් ඡන්දයක් ද;

වශයෙන් වන පරිදි සංගම් ව්‍යවස්ථාවට ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු අතර ඒ අනුව කටයුතු කළ යුතු ය.

කෙසේ වෙතත්;

සාමාජික සංගම් සඳහා ඡන්ද හිමිකම ලැබීමට හෝ ලබා ගැනීමට පහත සඳහන් අවම අවශ්‍යතා හෝ සපුරා තිබිය යුතු ය.

i. වාර්ෂික සාමාජික මුදල් නියමිත දිනට ගෙවා තිබීම.

ii. ජාතික සංගමයේ / සම්මේලනයේ ලියාපදිංචි වී හෝ සාමාජිකත්වය ලබා වසර දෙකක කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ දිසා ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර තිබීම.

iv. සෑම සාමාජික සංගමයක්ම තම සංගමයට, සංවිධානයට අනුබද්ධ සාමාජික සංගම් නිලවරණයට අදාළ වර්ෂයේ අගෝස්තු මස 01 වන දින සිට ජනවාරි මස 01 වන දින වන විට මහා සභා රැස්වීම් පවත්වා අවසන් කළ යුතු අතර, සෑම වර්ෂයකම මැයි 31 වන දිනට පෙර මහා සභා රැස්වීම් පැවැත්විය යුතු වීම.

v. ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ තම වාර්ෂික වාර්තා, මහා සභා රැස්වීම් වාර්තා, නිලවරණ සම්බන්ධ වාර්තා සහ නිලධාරීන්ගේ සියලු විස්තර ඇතුළත් වාර්තා හා සාමාජික සාමාජිකාවන්ගේ වාර්තා, ගිණුම් වාර්තා, ප්‍රාදේශීය ක්‍රීඩා නිලධාරිවරයාට සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 දිනට පෙර භාර දී තිබීම.

vi. ජාතික ක්‍රීඩා සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන, ක්‍රීඩා තරගාවලි අතරින් අවම වශයෙන් තරගාවලි දෙකකට කණ්ඩායම් හෝ ක්‍රීඩකයින් සහභාගී කරවා තිබීම.

vii. පුහුණු කඳවුරු හා පුහුණු පාඨමාලා වර්ෂය තුළ අඛණ්ඩව පවත්වා තිබීම. (අවම වශයෙන් දහයක් (10) පවත්වා තිබීම)

viii. ක්‍රීඩාවේ විනය හෝ සංගම් ව්‍යවස්ථාවේ විනය කඩ කිරීම සම්බන්ධයෙන් අදාළ වර්ෂය තුළ තහනමකට ලක්ව නොතිබීම.

ix. තම දිස්ත්‍රික්කය තුළ හෝ පළාත තුළ හෝ ක්‍රීඩා සමාජ මට්ටමින් පිරිමි, කාන්තා, කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ක්‍රීඩක සංචිත හා පුහුණු පවත්වා ගෙන යාම.

x. පුරෝගාමී ක්‍රීඩා සමාජ සහ විශේෂ සංගම් සතු තම ක්‍රීඩාවට අදාළ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සපුරා තිබීම, (ක්‍රීඩාංගණ, පිහිනුම් තටාක, ටෙනිස් පිටි ආදී)

xi. තම ක්‍රීඩාවට අදාළ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගෙන් (දෘශ්‍යාබාධිත, ශ්‍රවණාබාධිත, කායික ආබාධිත යනාදී) සමන්විත අනුබද්ධ ක්‍රීඩා සමාජයන් ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

කෙසේ වෙතත් යම් සාමාජික සංගමයක් විසින් පෙර කී පහසුකම් නිසි පරිදි සපුරා නොමැති නම්, ඡන්ද බලය හෝ සාමාජිකත්වය තාවකාලිකව හෝ පූර්ණකාලීනව අත්හිටුවීමට කටයුතු කළ යුතු ය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාමසේවා වසමක ම ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සඳහා, ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ, දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් හා පළාත් ක්‍රීඩා සංගම් ඇති කිරීමට ක්‍රියා කළ යුතු ය. ක්‍රීඩාවට ලැදි සියලු පුරවැසියන්ට තම අභිමතය පරිදි ක්‍රීඩාවක නියැලීමේ මානුෂික අයිතිවාසිකම ලබාදීම, එම ක්‍රීඩා සංගමයේ වගකීමකි. යම් සාමාජික සංගමයක් විසින් පෙර කී පහසුකම් සියල්ලම සපුරා නොමැත්තේ නම්;

මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට A ශ්‍රේණියේ සංගමයක් වසර පහක (05) කාල සීමාවක් තුළ පෙර කී පහසුකම් සපුරා ගැනීමට කටයුතු කළ යුතු ය. (අවම වශයෙන් එක් වසරකට දිස්ත්‍රික්ක තුනක ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ සහ දිස්ත්‍රික් සංගම් පිහිටුවීම සහ තම සංගමයට අදාළ ක්‍රීඩාව සඳහා යටිතල පහසුකම් සපුරා ගැනීම)

මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට B ශ්‍රේණියේ සංගමයක් වසර අටක (08) කාල සීමාවක් තුළ පෙර කී පහසුකම් සපුරා ගැනීමට කටයුතු කළ යුතු ය. (අවම වශයෙන් එක් වසරකට දිස්ත්‍රික්ක දෙකක ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ සහ දිස්ත්‍රික් සංගම් පිහිටුවීම සහ තම සංගමයට අදාළ ක්‍රීඩාව සඳහා යටිතල පහසුකම් සපුරා ගැනීම)

මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට C ශ්‍රේණියේ සංගමයක් වසර දහයක (10) කාල සීමාවක් තුළ පෙර කී පහසුකම් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. (අවම වශයෙන් එක් වසරකට දිස්ත්‍රික්කයක ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ සහ දිස්ත්‍රික් සංගම් පිහිටුවීම සහ තම සංගමයට අදාළ ක්‍රීඩාව සඳහා යටිතල පහසුකම් සපුරා ගැනීම)

ඉහත අවශ්‍යතා නිසි පරිදි සපුරා නොමැති සාමාජික සංගම් සඳහා ඡන්ද බලය හෝ සාමාජිකත්වය තාවකාලිකව හෝ පූර්ණකාලීනව අත්හිටුවීමට ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කළ යුතු ය.

තවද;

(7) 2020.09.23 හා අංක 2194/54 සහ 1986.01.20 දිනැති හා අංක 385/7A, දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග මගින් සංශෝධිත, 1974 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 130 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1974 අංක 3 දරන ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩාවලට සහභාගීවන්නන් පාලනය කිරීමේ නියෝගවල 6(ක) වගන්තියට ඉක්බිතිවම 6(ග) වගන්තිය ඇතුළත් කිරීමෙන් එකී නියෝග පහත පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

6 (ග). ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩාවලට සහභාගීවන ක්‍රීඩක ක්‍රීඩිකාවන්, කළමණාකරුවන් සහ අනෙකුත් නිලධාරීන් ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී කරනු ලබන විනය විරෝධී හැසිරීමක් හෝ ශ්‍රී ලංකාව අපකීර්තියට පත්වන ක්‍රියාවක් හෝ තම වගකීම් හා යුතුකම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා, අමාත්‍යාංශ ලේකම් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන විධිමත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලබා දෙනු ලබන නිර්දේශ ප්‍රකාරව එකී ක්‍රීඩකයෙකු/ක්‍රීඩකයින්, ක්‍රීඩිකාවක/ක්‍රීඩිකාවන/කළමනාකරුවකු/ කළමනාකරුවන් හෝ අනෙකුත් නිලධාරියෙකු/නිලධාරිනියන්ට එරෙහිව හෝ ක්‍රීඩා සංගමයට එරෙහිව දඬුවමක්, තහනමක් හෝ අත්හිටුවීමක් ක්‍රියාත්මක කළ හැකි වන්නේ ය.

EOG 12 - 0206

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.